පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- බුද්ධ ධර්මය I ,II

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 3 විනාඩි 10

## I පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල 1, 2, 3, 4 පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(01) "මෙවන් පුතෙකු ලද මවෙක් පියෙක් නිවුණෝ වෙති." යනුවෙන් ප්‍රකාශ කළේ,
   i. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය විසිනි.   ii. යශෝදරා දේවිය විසිනි.
   iii. කිසා ගෝතමී දේවිය විසිනි.   iv. විශාඛා සිටුදේවිය විසිනි.

(02) **"බඹරා මල නොතලා රොන් ගන්නා සේ, භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් ප්‍රත්‍ය පහසුකම් සපයා ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක."** එහි ප්‍රත්‍ය පහසුකම් **පිළිවෙළින්** දැක්වෙන්නේ,
   i. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යි.   ii. පිණ්ඩපාත, චීවර, සේනාසන, ගිලන්පස යි.
   iii. චීවර, සේනාසන, පිණ්ඩපාත, ගිලන්පස යි.   iv. ගිලන්පස, පිණ්ඩපාත, චීවර, සේනාසන යි.

(03) බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට බෞද්ධයකු වීමේ පළමු පියවර ලෙස සැලකෙන්නේ,
   i. සද්ධාසම්පන්න වීමයි.   ii. බුදුන් සරණ යාමයි.
   iii. දහම් සරණ යාමයි.   iv. තෙරුවන් සරණ යාමයි.

(04) ජලයේ පාසි දක්නට ඇත්නම් ඒ තුළ කිසිවක් නොපෙනේ. එමෙන්ම සිතෙහි උදාසීන බව පවතී නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. එහි උදාසීන කම යනුවෙන් පෙන්වා දී ඇත්තේ,
   i. කාමච්ඡන්දය යි.   ii. ව්‍යාපාදය යි.   iii. ථීනමිද්දය යි.   iv. උද්දච්ච කුක්කුච්චය යි.

(05) ඇත්ත ඇති සැටියෙන් දැකීමේ නුවණ බුදු දහමේ හඳුන්වා ඇත්තේ පඤ්ඤා යනුවෙනි. එම තත්ත්වය ලබා ගැනීමට කළ යුත්තේ පඤ්ඤා භාවනාව වැඩීමයි. එම භාවනාව වන්නේ,
   i. බුද්ධානුස්සති භාවනාව යි.   ii. ආනාපානසති භාවනාව යි.
   iii. මෛත්‍රී භාවනාව යි.   iv. විපස්සනා භාවනාව යි.

(06) ආගමික ජාතික වශයෙන් ලක් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කළ වැලිවිට අසරණ සරණ හිමියන් ඇතුළු පිරිස ලක්දිවට උපසම්පදාව රැගෙන ආවේ,
   i. බුරුමයෙනි.   ii. ඉන්දියාවෙනි.   iii. තායිලන්තයෙනි.   iv. මාලදිවයිනෙනි.

(07) වැසි සමයේ මසුන් අල්ලා නොගෙන පසුව සිඳීගිය විල දෙස බලා පසුතැවිලි වන කොස්වා ලිහිණියෙකු මෙන් තැවෙන්නේ .................................... හේතුවෙනි.
   i. ළමා කාලයේ ඉගෙන නොගැනීම   ii. තරුණ කාලයේ ධනය රැස්කර නොගැනීම
   iii. බඹසර නොහැසිරීම   iv. සුදුසු කල සුදුසු දේ නොකිරීම

(08) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතු වන කරුණු,
   i. හතරකි.   ii. පහකි.   iii. හයකි.   iv. හතකි.

(09) සදිසා නමස්කාරයෙහි බටහිර දිශාව ලෙස තෝරාගෙන ඇත්තේ,
   i. ගුරු සිසු සබඳතාව යි.   ii. ස්වාමි භාර්යා සබඳතාව යි.
   iii. ගිහි පැවිදි සබඳතාව යි.   iv. හිත මිතුරු සබඳතාව යි.

(10) මිනිසුන්ගේ අංග ලක්ෂණ බලා අනාවැකි ප්‍රකාශ කළ හැකි වූව ද, බුදුරජාණන් වහන්සේගේ පා සලකුණු බලා අනාවැකියක් ප්‍රකාශ කිරීමට නොහැකි වූ බමුණා වූයේ,
   i. කොණ්ඩඤ්ඤ බමුණා ය.   ii. ද්‍රෝණ බමුණා ය.
   iii. අග්ගික භාරද්වාජ බමුණා ය.   iv. සෝණදණ්ඩ බමුණා ය.

(11) "සමග්ගා හෝත මා විවදත" යන බුද්ධ දේශනාවේ අදහස වන්නේ,

i. සමගි වී විවාද කරන්න. ii. සමගිවන්න විවාද නොකරන්න.
iii. විවාද නොකරන්නා සමගි වේ. iv. සමගිය ම යහපති.

(12) දෙවන ආත්ම භවයෙන් පසු කවර හෝ ආත්ම භවයක දී විපාක දෙන කර්මය ලෙස හැඳින්වෙන්නේ,

i. දිට්ඨධම්මවේදනීය කර්මය ii. උපපජ්ජවේදනීය කර්මය
iii. අපරාපරියවේදනීය කර්මය iv. අහෝසි කර්මය

(13) බුදු දහමේ පංච උපාදන ස්කන්ධ ඉගැන්වීමේ දී රූප ස්කන්ධය හඳුන්වා දී ඇත්තේ,

i. දිය බුබුලකටය. ii. පෙණපිඬකටය. iii. මිරිඟුවකටය. iv. කෙසෙල් කඳකටය.

(14) චෛත්‍ය නිර්මාණයේ දී ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ආකාර කීයක් දක්නට ලැබෙන්නේ ද?

i. හතරකි. ii. පහකි. iii. හයකි. iv. අටකි.

(15) **"ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවුරුන් ද? කාගේ දහමක් ඔබ රුචි කරන්නේ ද?"** යන සංවාදය සිදු වූයේ,

i. උපතිස්ස පරිබ්‍රාජකයා - අස්සජි මහරහතන් වහන්සේ අතර ය.
ii. කෝලිත පරිබ්‍රාජකයා - අස්සජි මහරහතන් වහන්සේ අතර ය.
iii. සංජය පරිබ්‍රාජකයා - මුගලන් මහරහතන් වහන්සේ අතර ය.
iv. කෝලිත පරිබ්‍රාජකයා - සැරියුත් මහරහතන් වහන්සේ අතර ය.

(16) බරණැස ඉසිපතනාරාමයේ දී චතුරාර්ය සත්‍ය ඇතුළත් දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළේ,

i. ඇසළ පුර පසළොස්වක පොහොය දිනක දී ය.
ii. වෙසක් පුර පසළොස්වක පොහොය දිනක දී ය.
iii. පොසොන් පුර පසළොස්වක පොහොය දිනක දී ය.
iv. වප් පුර පසළොස්වක පොහොය දිනක දී ය.

(17) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වී සති හතක් විවිධ ස්ථානවල ගත කළ සේක. එහි දී කළගුණ සැලකීමක් වශයෙන් ඇසතු බෝධිය දෙස බලා සිටියේ,

i. පළමු සතියේ දී ය. ii. දෙවන සතියේ දී ය.
iii. තුන්වන සතියේ දී ය. iv. හතරවන සතියේ දී ය.

(18) බුදුරාජණන් වහන්සේ විවිධ අවස්ථාවන්හි දී ගිලන් වූ භික්ෂූන් වෙත වැඩම කොට පිරිත් දේශනා කළ සේක. එලෙස ගිරිමානන්ද හිමියන්ට දේශනා කළ සූත්‍රයේ ලෙඩ රෝග සෑදෙන ආකාර ............ දක්වා ඇත.

i. දෙකක් ii. හතරක් iii. පහක් iv. අටක්

(19) ශාසන ඉතිහාසයේ පැවති ධර්ම සංගායනා අතරින්, පුස්තකාරූඪ සංගීතිය ලෙස හැඳින්වෙන්නේ,

i. පළමු ධර්ම සංගායනාව යි. ii. දෙවන ධර්ම සංගායනාව යි.
iii. තුන්වන ධර්ම සංගායනාව යි. iv. හතරවන ධර්ම සංගායනාව යි.

(20) චෛත්‍ය නිර්මාණයේ දී ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ආකාර කීයක් දක්නට ලැබෙන්නේ ද?

i. හතරකි. ii. පහකි. iii. හයකි. iv. අටකි.

(21) සිංහල සාහිත්‍යයේ මහා කාව්‍ය ග්‍රන්ථයක් වන කව් සිළුමිණ ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

i. පළමුවන පරාක්‍රමබාහු රජු ය. ii. දෙවන පරාක්‍රමබාහු රජු ය.
iii. තුන්වන පරාක්‍රමබාහු රජු ය. iv. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.

(22) බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ සප්ත අපරිහානී ධර්ම අනුගමනය කළේ,

i. වජ්ජි රජ දරුවන් ය. ii. අජාසත් රජු ය.
iii. බිම්බිසාර රජු ය. iv. සුද්දෝධන රජු ය.

(23) ලොව්තුරු සුවයේ පදනම වන්නේ,

i. ප්‍රඥාව යි. ii. සමාධිය යි. iii. ශීලය යි. iv. සම්මා දිට්ඨිය යි.

(24) ආලවක යක්ෂයා දමනය කිරීමෙන් බුදුරජාණන් වහන්සේගේ කවර ගුණයක් ප්‍රකට වන්නේ ද?

i. තාදී ගුණය ii. පුරිසධම්ම සාරථී ගුණය
iii. ඉවසීමේ ගුණය iv. යථාවාදී තථාකාරී ගුණය

(25) බුදුරජාණන් වහන්සේ "බ්‍රහ්ම දණ්ඩය" පැනවීමට අනුදැන වදාළේ,

i. කෝකාලික භික්ෂුවට ය. ii. අංගුලිමාල තෙරුන් වහන්සේට ය.
iii. ඡන්න තෙරුන් වහන්සේට ය. iv. සුභද්‍ර භික්ෂුවට ය.

(26) සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ යනු,
i. ත්‍රිවිධ චෛත්‍යය යි.
ii. තුන්තරා බෝධිය යි.
iii. ත්‍රිවිධ බුදුවරු යි.
iv. තෙරුවන යි.

(27) **"දූරංගමං ඒක චරං...."** යන ගාථාවෙන් අදහස් වන්නේ,
i. ඍද්ධියෙන් වැඩම කරන ස්වාමීන් වහන්සේ යි.
ii. දුර ගමන් යන දුම්රිය යි.
iii. දුර වැඩම කරන ස්වාමීන් වහන්සේ යි.
iv. දුර ගමන් කරන සිතයි.

(28) 1864 සැප්තැම්බර් 17 වැනි දින උපත ලබන්නේ,
i. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.
ii. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.
iii. රේණුකානේ චන්ද්‍රවිමල හිමි ය.
iv. අනගාරික ධර්මපාලතුමා ය.

(29) "බෞද්ධයාගේ අත්පොත" ලෙස හැඳින්වෙන්නේ,
i. පිරිත් පොත් වහන්සේ යි.
ii. ජාතක පොත් වහන්සේ යි.
iii. ලෝවැඩ සඟරාව යි.
iv. ධම්මපදය ග්‍රන්ථය යි.

(30) ලෝවැඩ සඟරාව රචනා කරන ලද්දේ,
i. තොටගමුවේ රාහුල හිමි ය.
ii. වීදාගම මෛත්‍රී හිමි ය.
iii. වැත්තැවේ හිමි ය.
iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.

(31) මෙලොව දියුණුවට හේතු වන කරුණු හතරක් පිළිබඳව බුද්ධ දේශනාවක ඉගැන්වේ. එම සූත්‍රය වන්නේ,
i. අග්ගික භාරද්වාජ සූත්‍රය යි.
ii. මංගල සූත්‍රය යි.
iii. ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.
iv. පරාභව සූත්‍රය යි.

(32) **"ස්වාමීන් වහන්ස බොහෝ බමුණන් පැමිණ ඔවුහු තම තමන්ගේ ආගමික මතයම පවසති. එයම ප්‍රශංසා කරති. අනුන්ගේ මතයට ගරහති. හෙලා දකිති."** මෙසේ පැවසූවෝ කවරහු ද?
i. ශාක්‍ය වංශිකයන්
ii. කෝලිය වංශිකයන්
iii. කාලාම වැසියන්
iv. රජගහනුවර වැසියන්

(33) **"වැව යි දාගැබ යි ගම යි පන්සල යි"** යන්නෙන් නිරූපණය වන්නේ,
i. වැව් හදන තාක්ෂණය පිළිබඳව යි.
ii. පන්සල හදන වැඩ පිළිවෙළ පිළිබඳව යි.
iii. වැව දාගැබ පන්සල එක ළඟ පැවතිය යුතු බව යි.
iv. ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳව යි.

(34) බුදු දහමේ උගන්වන සතර බ්‍රහ්ම විහරණ ලෙස **පිළිවෙලින්** සඳහන් වන්නේ,
i. කරුණා, මුදිතා, උපේක්ෂා, මෙත්තා යි.
ii. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යි.
iii. මෙත්තා, මුදිතා, කරුණා, උපේක්ෂා යි.
iv. මෙත්තා, උපේක්ෂා, මුදිතා, කරුණා යි.

(35) බුදුරජාණන් වහන්සේ විසින් සුභ මානවකයාට දේශනා කළ සූත්‍රය වන්නේ,
i. චූල්ලකම්ම විභංග සූත්‍රය යි.
ii. ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි.
iii. මංගල සූත්‍රය යි.
iv. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.

(36) පටිච්ච සමුප්පාද ඉගැන්වීම අනුව තණ්හාව නිසා ...................... ඇතිවේ.
i. භවය
ii. උපාදානය
iii. දුක
iv. වේදනාව

(37) බුදු දහමේ උගන්වන ආකාරයට ලෝකයේ බලවත්ම රෝගය ලෙස සැලකෙන්නේ,
i. පිළිකාව යි.
ii. වකුගඩු රෝගය යි.
iii. හෘදරෝගය යි.
iv. බඩගින්න යි.

(38) පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් "දීඝ නිකාය"පැවරුනේ කුමන භාණක පරපුරකට ද?
i. සැරියුත් තෙරණුවන් ඇතුළු පිරිසට ය.
ii. අනුරුද්ධ තෙරණුවන් ඇතුළු පිරිසට ය.
iii. මහා කාශ්‍යප තෙරුණුවන් ඇතුළු පිරිසට ය.
iv. ආනන්ද තෙරණුවන් ඇතුළු පිරිසට ය.

(39) මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට පැමිණ පළමුව දේශනා කළ සූත්‍රය වන්නේ,

i. ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි.
ii. චූල්ලහත්ථි පදෝපම සූත්‍රය යි.
iii. අනත්ත ලක්ඛණ සූත්‍රය යි.
iv. මහා මංගල සූත්‍රය යි.

(40) බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් අඳින ලද්දේ,

i. රිචඩ් හෙන්රිකස් මහතා ය.
ii. එම්.සාලිස් මහතා ය.
iii. ජොර්ජ් කීට් මහතා ය.
iv. ඇල්බට් ධර්මසිරි මහතා ය.

* *

## II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ද, හිමි වේ.**

(1)

i. කෝට්ටේ යුගයේ රචිත කාව්‍යශේඛරය ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
ii. බුදුදහමේ පෙන්වා දෙන නොකළ යුතු වෙළඳාම් පහෙන් **දෙකක්** ලියන්න.
iii. බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රය දේශනා කළේ කවුරුන් උදෙසා ද?
iv. සිව් බඹ විහරණ නම් කරන්න.
v. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සඳහන් සම්මා වායාමය හෙවත් යහපත් උත්සාහයන් **දෙකක්** ලියන්න.
vi. සිදුහත් කුමරුගේ ශිෂ්‍ය ජීවිතයෙන් ගත හැකි ආදර්ශ **දෙකක්** ලියන්න.
vii. භික්ෂූන් වහන්සේ ගිහි ජනතාව උදෙසා සිදු කරන ආගමික සේවාවන් **දෙකක්** ලියන්න.
viii. දහම් ගුණයන්හි "අකාලික ගුණ" යන්නෙහි සරල අර්ථය ලියන්න.
ix. භාවනාවේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.
x. "අල්පේච්ඡ" යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 2x10=20)

(2)

i. බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් අභියෝග **දෙකක්** ලියන්න.
ii. බුදුරජාණන් වහන්සේ තුළ දක්නට ලැබුණු ගුණ අනන්ත යි. ඒ අතරින් **එකක්** පැහැදිලි කරන්න.
iii. බුදුරජාණන් වහන්සේගේ ගුණයන් මඟින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට හේතු වන ආකාරය පැහැදිලි කරන්න.

(3)

i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ස්වාමි භාර්යා සබඳතාව පෙන්වා දුන් දිසාව නම් කරන්න.
ii. ස්වාමියාගෙන් භාර්යාවට ඉටුවිය යුතු යුතුකම් පහෙන් **තුනක්** ලියන්න.
iii. ස්වාමි භාර්යා යුතුකම් ඉටු කිරීම තුළින් යහපත් පවුල් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(4)

i. ශාසන ඉතිහාසය තුළ පවත්වන ලද දෙවන ධර්ම සංගායනාවට මුල් වූ හේතුව පැහැදිලි කරන්න.
ii. දෙවන ධර්ම සංගායනාව පැවැත්වූ කාලය, ප්‍රධානත්වය හා දායකත්වය දැරුවන් කවුරුන් ද?
iii. "විනයෝ නාම සාසනස්ස ආයු" විනය ශාසනයේ ආයුෂය වේ. යන්න ධර්ම සංගායනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(5)

i. **"නතං කම්මං කතං සාධු "** යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එම ගාථාවේ සරල අදහස ලියා දක්වන්න.
iii. සමාජයේ ජීවත් වන සෑම පුද්ගලයකුටම ධම්ම පදය ග්‍රන්ථය තුළින් උපදෙස් ලබා දී ඇත. ඒ බව පෙන්වා දෙමින් කරුණු දක්වන්න.

(6)

i. බුද්ධ කාලීන භාරතයේ දක පැවති ප්‍රධාන පාලන ක්‍රම දෙක නම් කරන්න.
ii. සප්ත අපරිහානි ධර්ම අතරින් **තුනක්** ලියන්න.
iii. සප්ත අපරිහානි ධර්ම අනුගමනය කරමින් යහපත් රාජ්‍යය පාලනයක් ඇති කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරා කෙටි සටහනක් ලියන්න.

i. සඳකඩ පහණ
ii. දසරාජ ධර්ම
iii. අනගාරික ධර්මපාලතුමා
iv. ත්‍රිලක්ෂණය

(ප්‍රශ්න අංක 2 සිට 6 දක්වා i කොටසකට ලකුණු 02 යි, ii කොටසකට ලකුණු 03 යි, iii කොටසකට ලකුණු 05 යි.)

* * *

බුද්ධ ධර්මය
1 පත්‍රය

**පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 2 | 21 | 4 | 31 | 1 |
| 02 | 4 | 12 | 1 | 22 | 4 | 32 | 2 |
| 03 | 2 | 13 | 1 | 23 | 3 | 33 | 4 |
| 04 | 2 | 14 | 3 | 24 | 4 | 34 | 2 |
| 05 | 1 | 15 | 3 | 25 | 3 | 35 | 2 |
| 06 | 3 | 16 | 2 | 26 | 3 | 36 | 1 |
| 07 | 1 | 17 | 4 | 27 | 3 | 37 | 1 |
| 08 | 3 | 18 | 3 | 28 | 4 | 38 | 2 |
| 09 | 1 | 19 | 1 | 29 | 3 | 39 | 1 |
| 10 | 3 | 20 | 3 | 30 | 2 | 40 | 3 |

බුද්ධ ධර්මය
11 පත්‍රය

**පිළිතුරු**

1. (i) මහල්ලෙක්,ලෙඩෙක්,මළමිනිසෙක් හා පැවිදි රුවක් (ලකුණු 2 යි)

(ii) කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා හා ධම්මානුපස්සනා යන සතරෙන් දෙකක් (ලකුණු 2 යි)

(iii) නිබද්ධ චාරිකා (ලකුණු 2 යි)

(iv) පාරමී, උප පාරමී හා පරමත්ථ පාරමී (ලකුණු 2 යි)

(v) විදර්ශනා භාවනාව / විපස්සනා භාවනාව / ත්‍රි ලක්ෂණ භාවනාව / ප්‍රඥා භාවනාව (ලකුණු 2 යි)

(vi) කණිෂ්ක රජතුමා (ලකුණු 2 යි)

(vii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම / නිල්ලක්ගම (ලකුණු 2 යි)

(viii) දෙවන පරාක්‍රමබාහු රජතුමා / දෙවන පැරකුම්බා රජු / කලිකාල සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජු,

රචනා කිරීමට තේමා කර ගෙන ඇත්තේ - **කුස ජාතකය** (ලකුණු 2 යි)

(xi) සිත සන්සුන් කරන්නේ සමථය යි. (ලකුණු 2 යි)

(x) අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ (ලකුණු 2 යි)

2. (i) දුක්ඛ ආර්ය සත්‍යය හා දුක්ඛ සමුදය ආර්ය සත්‍යය

(ලකුණු 2 යි)

(ii) **කාම තණ්හා** යනු පස්කම් සැපතට ඇති ආශාවයි. එනම් පංච කාම වස්තූන් ලබා ගනිමින් ඇස, කණ ආදී ඉදුරන් පිනවීමට ඇති අසීමිත කැමැත්ත කාම තණ්හාව වේ.

**භව තණ්හා** යනු ආත්මය පිළිබඳ හැඟීම මුල් කොට ගෙන ඇති වන ආශාවයි. මම නිත්‍ය වශයෙන් දිගින් දිගට ම සසර සැප විඳිමි යන අපේක්ෂාවයි.

**විභව තණ්හා** යනු පරලොව නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාවයි.

(ලකුණු 3 යි)

(iii) චතුරාර්ය සත්‍යයෙන් ආදර්ශය ගෙන අප පළමුවෙන් ම ජීවිතයේ එදිනෙදා මුහුණපාන්නට සිදු වන ගැටලු හඳාරා එය මැනවින් තේරුම් ගත යුතු ය. දෙවනු ව එම ගැටලුවලට තුඩු දී ඇති හේතු අනාවරණය කර ගත යුතු ය. තෙවනුව විසඳුම කුමක් දැයි අවබෝධ කර ගත යුතු ය. සිව් වනු ව විසඳන මග ගමන් කළ යුතු ය. මේ ආදී වශයෙන් සපයන පිළිතුරක් අපේක්ෂා කෙරේ.

තව ද ජීවන ගැටලු ඇති වීමට තණ්හාව හේතු වන අයුරු හා තණ්හාව දුරලීම මගින් ඒවා විසඳා ගත හැකි ආකාරය විස්තර කර තිබීම, අන්තගාමී නොවී කටයුතු කිරීමෙන් ගැටලු නිරාකරණය කර ගත හැකි ආකාරය විස්තර කර තිබීම ආදිය ද නිවැරදි ය.

(10 ශ්‍රේණිය 15 පාඩම බලන්න) (ලකුණු 5 යි)

3. (i) දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජවේදනීය, අපරාපර්යවේදනීය හා අහෝසි කර්ම මෙයින් දෙකක්

(ලකුණු 2 යි)

(ii) ප්‍රාණඝාතය (සතුන් මැරීම), අදත්තාදානය (සොරකම් කිරීම), කාමමිථ්‍යාචාරය (කාමය වරදවා හැසිරීම)

(ලකුණු 3 යි)

(iii) අකුසලයෙන් වැළකීමෙන් මෙලොව දී දුක් කරදර නින්දා අපහසවලට භාජනය නොවීමට හේතු වන ආකාරයත්, පරලොව වශයෙන් දුගතිගාමී වී සතර අපායාදි දුක් විඳීමට සිදු වන ආකාරයත් විස්තර කර තිබීමත් කුසලයෙහි යෙදීමෙන් මෙලොව වශයෙන් සැප සම්පත්, කීර්ති ප්‍රශංසා, ආත්ම තෘප්තිය ආදිය ලබා ගත හැකි ආකාරයත් පරලොව වශයෙන් සුගතිගාමී වී දිව්‍ය මනුෂ්‍යාදී සැප සම්පත් විඳීමටත් සාසංසාරික දුකින් නිදහස්ව සදාකාලික සැපතට පත්වීමට එනම් නිවන් සුව පවා ලබාගත හැකි ආකාරය විස්තර කර තිබීමත් නිවැරදි ය.

(10 ශ්‍රේණිය 12 පාඩම හා 11 ශ්‍රේණිය 11 පාඩමත් බලන්න)

(ලකුණු 5 යි)

4. (i) අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ

(ලකුණු 2 යි)

(ii) යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහි ම ය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

(ලකුණු 3 යි)

(iii) ශිෂ්‍යයෙකු වශයෙන් තම අධ්‍යාපනය සාර්ථක කර ගැනීමටත්, ගුණ ධර්ම මගින් චරිතය සංවර්ධනය කර ගැනීමටත්

ධම්මපද ඉගැන්වීම් ගෙනහැර දක්වමින් කරුණු දැක්වීම අවශ්‍ය වේ. (11 ශ්‍රේණිය 6 පාඩම)

(ලකුණු 5 යි)

5. (i)

- ආසන්න හේතුව සුභද්‍ර භික්ෂුව විසින් කරන ලද නොමනා ප්‍රකාශය
- බුදුරදුන් ධරමාන කාලයේ ම ධර්ම විනය විරෝධීව හැසිරුණු භික්ෂූන්ගේ හා ධර්මය සාවද්‍ය ලෙස අර්ථ කථනය කළ භික්ෂූන්ගේ ක්‍රියාකලාපය
- විසිරී තිබූ ධර්ම විනය එක්තැන් කොට සංග්‍රහ කිරීමේ අවශ්‍යතාව
- ධර්ම විනය සුරක්ෂිත කොට කට පාඩමින් පවත්වාගෙන යාමට භාණක පරපුරකට පැවරීමේ අවශ්‍යතාව
- ආනන්ද හිමියන්ට එල්ලවී තිබූ චෝදනා විභාග කිරීම හා නිදොස් බව තහවුරු කිරීම

කරුණු දෙකක් ලියා තිබීම ප්‍රමාණවත්

(ලකුණු 2 යි)

(ii) පළමු වන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය - රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාද්වාරය අභියස / රජගහනුවර වේභාර පර්වතය පාමුල / රජගහනුවර සප්තපර්ණී ගුහාද්වාරයේ / සප්තපර්ණී ගුහා ද්වාරයේ / රජගහනුවර

මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහ රහතන් වහන්සේ - මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ / මහා කශ්‍යප හිමි / මහ කසුප් හිමි

සහභාගණී වපූ හි ක්ෂූන් වහන්ශ් ස්ලා සංඛ්‍යාව - පන්සියයක්

(ලකුණු 3 යි)

(iii)

- විසිරී පැවති ධර්මය හා විනය ඒකරාශී වීම
- ධර්මය හා විනය කොටස් කර භාණක පරම්පරා වෙත පැවරීම
  1. දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
  2. මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
  3. අංගුත්තර නිකාය - අනුරුද්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
  4. සංයුත්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
  5. ඛුද්දක නිකාය - සියලු ම භික්ෂූන් වහන්සේලා ට ද

  විනය පිටකය උපාලි තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද පැවරීම
- කුඩා අනුකුඩා ශික්ෂාපද වෙනස් නොකට එලෙසම පවත්වාගෙන යාමට තීරණය කිරීම
- සුභද්ද වැනි අධර්මවාදී අවිනයවාදී භක්ෂූන් නිහඬ කරවීම
- ආනන්ද හිමියන්ට එල්ලවී තිබූ චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීම

(ලකුණු 5යි)

6. (i) ධ්‍යාන මුද්‍රාව / අභය මුද්‍රාව / විතර්ක මුද්‍රාව / ධර්මචක්‍ර මුද්‍රාව / භූමි ස්පර්ශ මුද්‍රාව

මෙයින් දෙකක් නම් කිරීම

(ලකුණු 2යි)

(ii)

- ධ්‍යාන මුද්‍රාව (සමාධි මුද්‍රාව) - වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හිඳ උකුල මත වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව

  උදා - මහමෙව්නාවේ සමාධි පිළිමය, පොළොන්නරුවේ ගල් විහාරයේ සමාධි පිළිමය.
- අභය මුද්‍රාව - දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘතව පෙන්වීම. ලෝක සත්ත්වයාට උරුම ව ඇති සසර බිය දුරු කිරීම පිළිබිඹු කෙරේ.

  උදා - අවුකන පිළිමය, රැස්වෙහෙර හිටි පිළිමය, බුදුරුවගල හිටි පිළිමය
- ධර්මචක්‍ර මුද්‍රාව - අත් දෙකම පපුවේ මට්ටමට ඔසවා තබාගෙන දකුණු අත්ල පිටතට හරවා මහපටගිල්ලේ හා දබර ඇඟිල්ලේ තුඩු දෙක ස්පර්ශ වන අයුරින් කවයක් සෑදෙන ලෙස එකට තබාගෙන ඇත. අනතුරු ව පපුව ප්‍රදේශයට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් නිරූපිත මුද්‍රාව

  උදා - ඉන්දියාවේ සාරානාත් බුද්ධ ප්‍රතිමාව
- වරද මුද්‍රාව - දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබීම

  වරදානය මේ තුළින් සංකේතවත් කෙරේ.

උදා - ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධ ප්‍රතිමාව

- භූමි ස්පර්ශ මුද්‍රාව උකුල මත වම් අත උඩට සිටින ආකාරයෙන් තබා ගෙන දකුණු අත දකුණු දණ හිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිග හැර පහළට හෙළා පොළොව දෙසට යොමු කර සිටීම
  මාර පරාජයේ දී පොළොව සාක්ෂි දැරීම සංකේතවත් කෙරේ.
- විතර්ක මුද්‍රාව - අත්ල පපු පෙදෙසට සමීප වන පරිදිදකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මහපට ඇඟිල්ල උඩට කවයක් ඇති වෙන ආකාරයෙන් තැබීම
  ගැටලු විසඳීමට බුදුරදුන් යොමු වීම සංකේතවත් කෙරේ.

මෙයින් එකක් හැඳින්වීම කළ යුතු ය. (11 ශ්‍රේණිය 18 පාඩම)

(ලකුණු 3යි)

(iii) ලොව කිසිදු ජාතියකට නොදෙවෙනි ඉතා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ජාතික උරුමයන් රාශියක් අප සතුව පවතී. එකී අතීත උරුමයන් මගින් හෙළ සංස්කෘතියේ ප්‍රෞඪත්වයත් අපගේ මුතුන්මිත්තන් තුළ පැවති ශක්තිය, කලා කෞශලයය මෙන් ම

පැරණි තාක්ෂණික ඥානය ද ලොවට හෙළි කරයි. එකී උරුමයන් අනාගත පරම්පරාවට ආරක්ෂා දායාද කර දීම අද දවසේ අපට පැවරී ඇති යුතුකමකි.

අප රටේ නන්විධ වූ ආගමික සිද්ධස්ථාන හා තදනුබද්ධ කලා කෘති, භාෂා සාහිත්‍යයික නිර්මාණ, පුරාවිද්‍යාත්මක වටිනාකම ඇති ස්ථාන හා වස්තූන්, වාරි කර්මාන්තයන් මෙන් ම සොබා දහමෙන් ලද නිර්මාණයන් ද අපගේ අතීත උරුමයන් අතර වේ.

අතීත උරුමයන් සුරක්ෂිත කරනු වස් විවිධ වූ ක්‍රියාකාරකම් අනුගමය කළ යුතු වේ. ඇතැමුන් සිතා මතා කරනු ලබන ක්‍රියාකාරකම් නිසා මේවා විනාශයට පත්වීමේ තර්ජනයකට මුහුණ පා තිබේ. පුරාවස්තු මංකොල්ලය, නිදන් හෑරීම, අන්තවාදී ක්‍රියා ආදිය නිසා අප උරුම කර ගෙන තිබෙන මෙම උරුමයන්ට හානි සිදු වීමට ඉඩ නොදිය යුතු ය. අවශ්‍ය නීතිරීති පැනවීම හා සාධාරණව නීතිය ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. මෙකී උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව තුළ මනා අවබෝධයක් ඇති කිරීම සඳහා ද විවිධ ක්‍රියාමාර්ග සිදු කළ යුතු ය. නොදැනුවත් භාවය මත සිදු වන මිනිස් ක්‍රියාකාරකම් හා ස්වභාවික හේතූන් මත සිදු වන විනාශයන් පිළිබඳව ද ජනතාව දැනුවත් කළ යුතු අතර ඒවා වැළැක්වීමට නිසි පියවර ගත යුතු ය. මෙවන් කරුණු ඇසුරු කොට ගෙන ලියන ලද පිළිතුරුවලට සම්පූර්ණ ලකුණු දිය හැකි ය. (10 ශ්‍රේණිය 20 පාඩම)

සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

(ලකුණු 5 යි)

7.

(i) දුටුගැමුණු රජතුමා

රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජතුමාගේ හා විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා දුටුගැමුණු කුමාරයා ය. හෙතෙම තම බාල සොහොයුරු තිස්ස කුමරු සමඟ දෙමාපියන්ගේ මඟ පෙන්වීම යටතේ මහා සංඝරත්නයේ අවවාද අනුශාසනා ලබා හැදී වැඩුණේ ය.

“මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජසැප පිණිස නොවේ.” යන ආදර්ශ පාඨය මුල් කර ගෙන සටන් ව්‍යාපාරය ගෙන යන ලදි. එහි ප්‍රතිඵලය වූයේ දශක කිහිපයක පටන් විනාශ මුඛයට යමින් පැවති රටේ ස්වධීනත්වය ආරක්ෂා කර ගනිමින් එළාර නම් විදේශීය පාලකයාගෙන් රට මුදාගෙන එක්සේසත් කිරීමයි.

භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබා රට පාලනය කළ සැදැහැති වූත් ශාසනමාමකත්වයෙන් යුක්ත වූත් රජ කෙනෙකි. සම්බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා රුවන්මැලිසෑය, මිරිසවැටිය, ලෝවාමහපාය, ඉදි කොට දැයට දායාද කළ රජු ධර්ම දේශනා උත්සව, වෙසක් උත්සව පවත්වන ලදි. ආරෝග්‍ය ශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කළ අතර පින් පොතක් ද පවත්වා ගෙන යන ලදි. එමෙන් ම කෘෂි කර්මාන්තය දියුණු කිරීමට ද සුවිශේෂී මෙහෙවරක් කරන ලදි.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5යි)

(ii) උට්ඨාන සම්පදා

කෘෂිකර්මය, වෙළඳාම, ගව පාලනය, දුන් ශිල්ප, රාජ්‍ය සේවය, ශිල්ප කර්මාන්ත යනාදී ධාර්මික රැකියාවක නියැලෙමින් උත්සහයෙන් (උට්ඨාන විරියාදිගතා) දැතේ මහන්සියෙන් (බාහාබල පරිචිතා) දහදිය හෙළා (සේදා වක්කිත්තා) ධාර්මිකව (ධම්මිකා)ධාර්මික ක්‍රියා අනුගමනයෙන්(ධම්ම ලද්ධා) කටයුතු කිරීම උට්ඨාන සම්පදාව බව ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වේ.

තව ද සිය රැකියාවෙහි දක්ෂ විය යුතු ය. අනලස් විය යුතු ය. උපායශීලී විමර්ශනශීලී විය යුතු ය. මැනවින් කටයුතු කිරීමටත් සංවිධානය කිරීමටත් සමත් විය යුතු ය. මෙකී ගුණාංගයන්ගෙන් යුතු ව කටයුතු කිරීම ද උට්ඨාන සම්පදාවට අයත් වේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5යි)

(iii) ස්තූපය

ජාතියේ අභිමානය මෙන් ම සම්බුදු සසුනේ නිර්මල ස්වරූපය අර්ථ ගන්වමින්, පුද්ගල මනස සංසුන් කොට දැහැමි ජීවන ප්‍රතිපදාවකට යොමු කරවන උසස් කලා නිර්මාණයක් ලෙස ස්තූපය හඳුන්වා දිය හැකි ය. රත්නමාලි මහසෑය, ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය ආදී දිවයිනේ නන්දෙස පිහිටි විවිධ ආකෘති අනුව ඉදි වූ ස්තූප හෙළ කලා ශිල්පීන්ගේ කුසලතාව මැනවින් ප්‍රකට කෙරෙන නිර්මාණයන් ය.

ගර්භයේ ස්වරූපය අනුව ස්තූපය ප්‍රධාන ආකාර හයකට බෙදා දැක්වේ. ඒවා නම්

1. ඝණ්ඨාකාර - ඝණ්ඨාරයක හැඩය ඇති
2. ඝටාකාර - කළයක හැඩය ඇති
3. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති
4. ධ්‍යාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
5. පද්මාකාර - නෙළුම් මලක හැඩය ඇති
6. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති

ශ්‍රී ලාංකේය ස්තූපයට අනන්‍ය වූ ස්තූප කොටස් තිබේ. ස්තූපාංග මගින් ද විද්වතුන් විසින් බුදු දහමට අදාළ ධර්ම කොටස් විවරණය කෙරෙයි.

1. පදනම - සුවාසූ දහසක් ධර්ම ස්කන්ධය
2. තුන් මහල් පේසාව - ත්‍රිවිධ රත්නය
3. ගර්භය - සත්තිස් බෝධිපාක්ෂික ධර්මය
4. හතරැස් කොටුව - චතුරාර්ය සත්‍යය
5. දේවතා කොටුව - දිව්‍ය ලෝකහො සතරවරම් දෙවිවරු
6. කොත් කැරැල්ල - නවාංග ශාස්තෘ ශාසනය
7. කොත - නිවන

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5යි)

(iv) පන්සිය පනස් ජාතක පොත

පාලි ජාතකට්ඨ කථාව ඇසුරෙන් කුරුණෑගල සාහිත්‍ය යුගයේ දී රචිත කෘතියකි. අප මහ බෝසතාණන් වහන්සේ පාරමී දම් පිරූ අයුරු දැක්වෙන ආත්මභවයන් පිළිබඳ කථා පුවත් මෙහි විස්තර වේ. ජාතක කථා 547 ක් අන්තර්ගත වන නමුත් පන්සිය පනස් ජාතක නමින් ව්‍යවහාර වන්නේ සුබෝච්ඡාරණය උදෙසා ය. පොත් වහන්සේ නමින් පූජනීයත්වයක් ලබා දීමට ද කටයුතු කර තිබේ. ධර්ම දේශනා ශෛලිය උපයෝගී කරගෙන මෙම ග්‍රන්ථය රචනා කොට තිබේ. ඒ අනුව එක් අයෙකු මෙය හඬ නගා කියවද්දී අනෙක් අය සාධුකාර දෙමින් අසා සිටීම සිරිතක්ව පවතී.

මෙහි අන්තර්ගත කථා පුවත්වලින් පුද්ගලයාගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිත සාර්ථකත්වය කර ගැනීමට අවශ්‍ය ජීවිතාදර්ශ මෙමගින් සැපයේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5යි)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න